# දේශීය නිල වෙදකම

පාරම්පරික වෛද්‍ය ඩබ්ලිව්. ඒ. එස්. ලියෝන් අමරනන්ද

දේශීය වෛද්‍ය ක්ෂේත්‍ර ගණනාවක් අතුරින් නිල වෙදකමට අතීතයේ රාජ්‍යමය වැදගත් කමක් හිමි ව තිබී ඇත. අනුරාධපුර යුගයේ රජකම් කල දුටුගැමුණු රජ හට ප්‍රධාන වෛද්‍යවරු සත් දෙනෙකු සිටි අතර ඉන් සර්වාංග නිල වෙදකම දැන සිටි වෛද්‍යවරයා ප්‍රධානත්වයෙන් ප්‍රධානත්වයට පත්ව සිට ඇත. නමුත් කාලයාගේ ඇවෑමෙන් නිල වෙදකම විනාශයට පත් වී තිබේ. එයට හේතු වන්නට ඇතැයි සැලකෙන්නේ අනුරාධපුර යුගයේ දී පැමිණි බැමිණිතියාසාය නම් දුර්භික්ෂයත් වලගම්බා රජු දවස අභයගිරි හා මහාවිහාරික භික්ෂූන් අතර ඇති වූ ගැටුමත් ය. ඉහත හේතුන් මගින් විනාශ වන්නට යෙදුනේ ධර්ම පුස්තක පමණක් නොව දේශීය සර්වාංග නිල වෙදකම ද ඉන් අභාවයට පත් වී තිබේ. දේශීය සහ ඉන්දීය චිකිත්සා ක්‍රම දෙවියන් ගෙන් ලද ශාස්ත්‍රයන් ය.

පාහියන් නම් භික්ෂුව ශ්‍රී ලංකාවේ සංචාරයකට පැමිණ ජීවත් වූයේ බලංගොඩ ආශ්‍රිතව ය. මේ කාලයේ දී හෙතෙම දුටු දක්ෂ නිල වෙදකම රූප සටහන් සහිත ව සටහන් කර ගෙන නැවත චීනයට පිටත් ව ගොස් ඇත. පසුකාලීන ව චීනය, ජපානය, කොරියාව ආදී දේශයන්ට ද නිල වෙදකම ව්‍යාප්ත වූ ආකාරය උන්වහන්සේ විසින් දක්වා ඇත. දේශීය නිල වෙදකම සුවිශේෂී වේ. එය සර්වාංග රෝග සඳහා ම යෙදිය හැකි වෛද්‍ය ක්‍රමයකි. කටු ගැසීම නොව ඇඟිලි තුඩින් නිල මර්දනය කිරීමක් මෙහි දී සිදු කරනු ලැබේ. නමුත් සමහර අවස්ථා වල දී පමණක් ලෝහ වර්ග උපයෝගී කර ගනිමින් සැකසූ උපකරණ යොදා ගනී.

නිල වෙදකම සඳහා මූලධර්ම හා සිද්ධාන්ත බෞද්ධ ආභාෂයකින් යුක්ත වූ බව පෙනී යයි. මන්දයත් බුදුරජාණන් වහන්සේ දේශනා කල පරිද්දෙන් ම ශරීරය තැනුම් ලත් දෙතිස් මහා කුණප කොටස් නිල වෙදකමෙහි ද මූලධර්ම යයි. ඒ අනුව ඕනෑම රෝගයක දී ශරීරයෙහි අසමතුලිත වන්නේ රුධිරයයි. වා, පිත, සෙම සහ මේදය යන දෝෂයෝ රුධිරය ඇසුරු කරමින් සිදු කරන අසමතුලිතතාවය ශරීරයේ රෝග මූලය බව ප්‍රකාශ කර ඇත. රුධිරය පිරිසිදු කිරීම, ධමනි - ශිරා නිසි අයුරින් ස්ථාපිත කිරීම, ස්නායු පද්ධතියේ ක්‍රියාකාරීත්වය විධිමත් කිරීම, ධමනි - ශිරා මුල් කර ගනිමින් ශරීරයේ සියලුම නාල ආදිය පිරිසිදු කිරීම, අස්ථීන් ගෙන් වන යම් අපහසුතා වේ නම් ඒවා මග හැරීම, රෝම කූප හරහා නිසි අයුරින් දහදිය පිට කිරීමට සැලැස්වීම, සාරාංශ ගත කල හොත් දෙතිස් මහා කුණපයෝ ම තාරුණ්‍යය කරා ලඟා කර වීම අරමුණ වෙති. එලෙස ම ඇස ඇතුලු ව පංච ඉන්ද්‍රිය මොලයෙහි ක්‍රියාකාරීත්වය යථා අයුරින් සිදු වීමට සලසා දේ. භික්ෂූන්ට, ක්ෂීරපායී සත්ත්වයන්ට, ජලජ ජීවීන්ට, සිවුපා සතුන්ට ප්‍රතිකර්ම ලබා දීමට මෙම නිල වෙදකමට හැකිය. ප්‍රතිකාර විෂයන් වශයෙන් සර්වාංග රෝග නම් කල හැකිය. ඉරුවාරදය ඇතුළු සියලුම ශීර්ෂ රෝග, අම්ලපිත්තය, ඇදුම, පීනස ආදී සෙම් පීඩාවන්, අපස්මාරය, අංශභාගය ආදී ස්නායු රෝග, සන්ධි රෝග, වකුගඩු ආබාධ, හෘදයාබාධ, කාන්තා රෝග, වන්ධ්‍යත්වය, මන්ද මානසිකත්වය, ළමාරෝග, උෂ්ණ රෝග මෙන්ම පිළිකා සඳහා ද නිල ප්‍රතිකාරය සාර්ථක වේ. නමුදු වයස අවු 80 ට වැඩි රෝගීන් සඳහා නිල මර්දනයෙන් උත්පාදනය වන ශක්තිය දැරීමේ හැකියාවක් නොමැති බැවින් එවැනි රෝගීන් සඳහා නිල වෙදකම කරනු නොලැබේ.

ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගියා ප්‍රකාශ කරන රෝගය හෝ පැමිණිල්ලට අනුව ප්‍රතිකාරය කරන නමුදු වසර ගණනාවක් පුරා පුරුදු පුහුණු කල භාවනා ශක්තිය යොදා ගනිමින් නිවැරදිව ම රෝගය හඳුනා ගැනීමට වෛද්‍යවරයාට හැකියාවක් පවතී. එම ශක්තිය භාවනාව, චිත්ත ශක්තිය හා බුද්ධ ශක්තිය එක්තැන් කරමින් සිදු කරනු ලැබේ. මෙහි අභ්‍යන්තර ඖෂධ භාවිතයක් හෝ ලේපන වර්ග යෙදීමක් නොවේ. රෝගියා භාවිත කරන ඖෂධ නතර කිරීමේ හැකියාව වුව ද පවතී. නමුත් රෝගින් සතු බිය හේතුවෙන් එසේ නොකරන අවස්ථා ඇත. නිල වෙදකමෙහි ඖෂධ මාධ්‍යය වන්නේ ආපෝ, තේජෝ, වායු, පඨවි සහ ආකාශ යන භූතයනුත් ඥානයත්ය. මිනිස් උපතේ දී ඉහත ධාතු මූලයන් ගෙන් විය හැකි දුර්වලතා සම්පූර්ණ කිරීම මෙම නිල වෙදකමේ දී සිදු වේ.